# එක්ව නංවන රටක් - සතුට පිරුණු දැයක්

## සර්වජන අදිටන් සම්මුතිය

අපගේ සදාදරණීය මාතෘභූමියත් එහි වෙසෙන සිංහල, දෙමළ සහ මුස්ලිම් යනාදී සකලවිධ ජනතාවත් මුහුණ දී සිටින්නේ නිදහසින් පසු යුගයේ දැවැන්තම ආර්ථික, සමාජයීය, දේශපාලනික, පාරිසරික සහ සංස්කෘතික පරිහානියටයි. අප මේ අර්බුදයන්ට මුහුණ දෙන මොහොතේ ගෝලීය සන්දර්භය එකී අර්බුදයන් තීව්‍ර කරන්නට දායක වෙමින් පවතියි.

"මිහිතලය අයිති මිනිසාට පමණකි" යන සංකල්පයේ පිහිටා කාර්මික විප්ලවයෙන් ද හරිත විප්ලවයෙන් ද සිදු කළ දැවැන්ත පාරිසරික විනාශය හමුවේ මිනිසුන් පමණක් නොව සමස්ත මිහිතලයම අද පැවැත්මේ තර්ජනයකට මුහුණ දී සිටියි. වරක් සුළි කුණාටු ලෙසින් ද තව වරක් මහ වැසි ලෙසින් ද තවත් වරක් නියඟ ලෙසින් ද අපට දැනෙන්නේ පාරිසරික විනාශය හමුවේ සොබාදහමේ කුපිත වීමයි.

සොබාදහම මිනිස් සංහතියේ පැවැත්මට තර්ජන එල්ල කරන මොහොතේ සාමූහිකව ඊට මුහුණ දෙනු වෙනුවට රාජ්‍යයන් ලෙස වෙන් වී මිනිස් ගුණ වළලමින් කලාපීය යුද ගැටුම් ලෝකය පුරා මතු වී ඇත. යුද ගැටුම් ලෙස ප්‍රකාශ වන්නේ සමස්ත ලෝකයම වෙලී ඇති ආර්ථික සහ සංස්කෘතික පරිහානියයි.

ලොව මුහුණපා ඇති ආර්ථික, පාරිසරික සහ සමාජයීය අර්බුදයන්ට විසඳුම් ප්‍රගතිශීලිත්වය, පරිසර හිතකාමීත්වය, අල්පේච්ඡත්වය, සාමූහිකත්වය සහ සමානාත්මතාවය මත පදනම් වුණු අපගේ සභ්‍යත්ව රාජ්‍යය තුළ ගැබ් වී ඇති බැව් අපි විශ්වාස කරමු. ජාති ආගම් භේදයකින් තොරව මේ උතුම් රට මව්බිම කරගත් සකලවිධ ජනතාවගේ උරුමය වුණු අපේ සභ්‍යත්වය දැවෙන ලොව සැනසීමට සමස්ත මානව වර්ගයා වෙත දායාද කළ හැකි බව ප්‍රකාශ කරන්නේ මහත් වූ අභිමානයෙනි.

අවාසනාවට එකී උරුමයන් පසෙක දමා ජාතික ආර්ථිකය බිඳ දමමින් ආනයන මත රැඳෙන ආනයන මූල්‍යනයට වාණිජ ණය ලබා ගන්නා නව ලිබරල්වාදී ආර්ථික දැක්ම 1977න් පසු බිහි වුණු සෑම ආණ්ඩුවකම ප්‍රතිපත්තිය විය. එකී නව ලිබරල්වාදී ආර්ථික උගුලේ දිගු කාලයක් පැටලී සිටීමේ ප්‍රතිඵලයක් ලෙස අප අද ණය ගෙවා ගැනීමට නොහැකි වීමෙන් බංකොලොත් වුණු සිඟමන් යදින පරාධීන ජාතියක් බවට පත් වී ඇත. ණය ගැති බවේ අසරණකම අයුතු ලෙස භාවිතා කරමින් ජාත්‍යන්තර මූල්‍ය ආයතන ද බලවත් රටවල් ද ශ්‍රී ලංකාව මත සිය ග්‍රහණය තර කරමින් සිටියි. එබැවින් වසර දහස් ගණනක් අපේ මුතුන් මිත්තන් දිවි පුදා සුරැකි ස්වාධීනත්වය අපට අහිමි වීමේ අවදානමක් ඉතිහාසයේ නොවූ විරූ ලෙසින් මතු වී ඇත.

ආනයන මත රැඳීමෙන් බිහි වුණු ගෙවුම් ශේෂ අර්බුදය හෙවත් විදේශ විනිමය අර්බුදයට අමතරව ගජ මිතුරන්ට බදු සහන ලබා දීමෙන් ද දූෂිත පාලකයින් සහ නිලධාරීන් විසින් බදු පැහැර හරින්නන් රකිමින් ද දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම අවම රටවල් අතරට අප මව්බිම ද තල්ලු කර ඇති අතර අතාර්කික නාස්තිකාර වියදම් හමුවේ එය රාජ්‍ය මූල්‍ය අර්බුදයක් හෙවත් අයවැය අර්බුදයක් බවට පත් කර ඇත.

ගෙවුම් ශේෂ අර්බුදයටත් රාජ්‍ය මූල්‍ය අර්බුදයටත් විසඳුම් ලෙස ඉහළ පොලී මත කෙටිකාලීන වාණිජ ණය ලබා ගැනීමෙන් ද ණය ගෙවීමට දිගුකාලීන වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් ණය ගෙවීම සඳහා ද ණය ලබා ගැනීමෙන් ද ණය කළමනාකරණය අභියෝගයක් බවට පෙරළමින් ණය අර්බුදයක් ද බිහි වී ඇත.

අපගේ හර පද්ධතිය විනාශ කර එහි අළු මත ඉදි කළ වත්මන් සමාජය විසින් මිනිස් ජීවිතවලට හුදු රුපියලින් අගය නියම වුණු ප්‍රචණ්ඩ සංස්කෘතියක් ද අවම අවශ්‍යතා ඉටු නොවීමෙන් අපේක්ෂා භංගත්වයට පත් තරුණ පරපුර මත්ද්‍රව්‍ය තුළින් ද හුදෙකලා වීමෙන් ද ව්‍යාජ ආශ්වාදයක් සොයන තත්ත්වයට පත්ව සිටියි.

නිදහසින් පසු අපගේ සභ්‍යත්ව රාජ්‍යය ගොඩ නැඟීමට අප අසමත් වීමෙන් ජන කණ්ඩායම් අතර පවතින අසහනය සහ අවිශ්වාසය මතු වන්නේ වාර්ගික ගැටුම් සහ ත්‍රස්තවාදී ක්‍රියා ලෙසිනි. එකී අසහනයන් රාජ්‍යය අස්ථාවර කිරීමේ ද රාජ්‍යය වක්‍රව පාලනය කිරීමේ ද මෙවලම් ලෙසින් භාවිතා කිරීමට ලෝක බලවත්තු පෙළෙඹී සිටිති.

යටත් විජිත අධ්‍යාපන ප්‍රතිපත්තියෙන් මිදීමට නොහැකි වීමේ ශාපයෙන් ජාතියේ අභිමානවත් උරුමයක් වුණු ව්‍යවසායක මගස අපට අහිමි වී නිර්මාණශීලිත්වය, සම්පත් කාර්යක්ෂම කළමනාකරණය සහ අවදානම් දැරීමේ හැකියාව අපෙන් තුරන් වී ඇත. ඒ නිසාම විජාතික සංකල්ප තුළින් අපේ ප්‍රශ්න විසඳාගැනීමට තැත් කරන දීන ජාතියක් බවට අප පත් වී ඇත.

අපේ ආදරණීය මව්බිම මුහුණ දී ඇති මෙකී අභියෝගයන් පිළිබඳ කම්පනයට පත් වී ඇති මතු අත්සන් තබන පක්ෂ නායකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි විවේචනය වෙනුවට විසඳුම් පිළිබඳ ද පොරොන්දු වෙනුවට උපායමාර්ගික වැඩපිළිවෙලක් පිළිබඳ ද විශ්වාසය තබමින් අපේ උරුමය මත දෙපා තබා ලොව සාධනීය නැවුම් ප්‍රවණතා උකහාගනිමින් නැඟී සිටින අදීන නවීන සුහුරු ජාතියක් බිහි කරනු වස් මතු දැක්වෙන මූලික ප්‍රතිපත්ති මේ මහපොළොවේ රෝපණය කිරීමට සාමූහිකව ප්‍රයත්න දැරීමේ අදිටනින් සම්මුතියට එළැඹුණු බවත් මෙකී ප්‍රතිපත්ති මත පිහිටා සැකසෙන උපායමාර්ගික වැඩසටහනක් නුදුරු දිනක ජාතියට හිළිණ කරන බවත් සමස්ත ජාතියට මෙයින් ප්‍රකාශ කර සිටිමු.

**එකී අරමුණ ඉටු කර ගනු වස්**

**01.** **ආත්ම විශ්වාසය බිඳ වැටුණු සර්ව අශුභවාදී මානසිකත්වය වෙනුවට අභිමානය සහ ආත්ම විශ්වාසය පිරුණු ව්‍යවසායක මනසකින් යුත් අභිප්‍රේරිත ජාතියක් ගොඩනැඟීමට පදනම දැමීමට ද**

**02.** **දැනුමින් පිරිපුන් නිරෝගී ජාතියක් බිහි කරන නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවාව යාවත්කාලීන කරමින් තහවුරු කිරීමට ද විශේෂ හේතු මත රැකවරණය ලැබිය යුතු ඉලක්කගත සියලු කණ්ඩායම් වෙත රාජ්‍ය ශුභසාධනය සැපයීමට ද**

**03.** **දේශීය සම්පත්, දැනුම සහ මානව ප්‍රාග්ධනය මත පදනම් වී රටටත් ලොවටත් අනගි දේ නිපදවන ජාතික ආර්ථිකයක් බිහි කිරීමට ද**

**04.** **ව්‍යවසායකත්ව මනසින් කළමනාකරණය දෙස බලන සවිමත් රාජ්‍ය, පෞද්ගලික සහ සමුපකාර අංශ ගොඩ නැඟීමට ද**

**05.** **අපනයන වෙළෙඳපොළ සහ භාණ්ඩ හා සේවා විවිධාංගිකරණයෙන් ද එකතු කළ අගයන් ඉහළ නැංවීමෙන් ද අපනයන ආදායම ඉහළ නැංවීමට ද එකී ආදායම මව්බිමට ගෙන එන බව තහවුරු කිරීමට ද**

**06.** **පසුගිය සමයේ සිදුවුණු මහ පරිමාණ දූෂණ විමර්ශනය කර සොරා ගත් ධනය ජනසතු කර වැරදිකරුවන්ට දඬුවම් කිරීමට සහ සෑම පුද්ගලයෙකුටම අනන්‍ය කේත අංකයක් ලබා දීමෙන් ද සියලුම ගෙවීම් පරිගණකගත කිරීමෙන් ද බදු පැහැර හැරීම ඇතුළු සමස්ත දූෂණය තුරන් කරන සුහුරු ආර්ථික පද්ධතියක් බිහි කිරීමට ද**

**07.** **තිරසර සංවර්ධන උපායමාර්ග කෘෂිකර්මය, බලශක්ති, කර්මාන්ත, ඉදිකිරීම් ආදී ක්ෂේත්‍රයන්ට හඳුන්වා දී මිනිසාගේ පමණක් නොව සමස්ත ජීවීන්ගේ ඉදිරි පැවැත්ම තහවුරු කිරීමට ද**

**08.** **බහුධ්‍රැව ලෝකය අවබෝධ කරගනිමින් ජාතික ප්‍රමුඛත්වය මත පදනම් වූ උපායමාර්ගිකව ලොව ඕනෑම රටක් හෝ රටවල් සාමූහිකයක් සමග සමතලයක සිට ගනුදෙනු කිරීමට ද**

**09.** **සභ්‍යත්ව රාජ්‍යයේ උරුමය මත පදනම්ව ජාති ආගම් කුල භේදයකින් තොර අභිමානවත් නවීන ජාතියක් ගොඩනැඟීමට ද**

**10.** **සතුට සැබෑ ධනය ලෙස දකිමින් භෞතික, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය තුලනාත්මක කරමින් සතුටු දැයක් නිර්මාණය කිරීමට ද මෙයින් ශපථ කර සිටිමු.**

| | | |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |
| **උදය ගම්මන්පිල** | **වාසුදේව නානායක්කාර** | **විමල් වීරවංශ** |
| නායක - පිවිතුරු හෙළ උරුමය | ලේකම් - ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ | නායක - ජාතික නිදහස් පෙරමුණ |
| ............................................ | ............................................ | ............................................ |
| **ජී. වීරසිංහ** | **ගෙවින්දු කුමාරතුංග** | **චන්න ජයසුමන** |
| ප්‍රධාන ලේකම් - ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය | සභාපති - යුතුකම ජාතික සංවිධානය | ස්වාධීන මන්ත්‍රී සංසදය |

............................................

**දිලිත් ජයවීර**

නායක - මව්බිම ජනතා පක්ෂය